## 12 ඒකකය - කළමනාකරණය

1.කළමනාකරණය පිළිබඳව ඇති නිර්වචනයේ ඇතුළත් සංකල්පයක් වන්නේ,

1.මානව ගතිලක්ෂණ
2.පෞරුෂය
3.ධූරාවලිය
4.සංවිධාන
5.සැලැස්ම

2.කළමනාකරුවෙකුගේ තීරණ භූමිකාවට අයත් උප භූමිකාවකි,

1.ආයතන ප්‍රධානියා
2.නියාමකයා
3.ව්‍යවසායකයා
4.මාධ්‍ය ප්‍රකාශකයා
5.සබඳතා පවත්වන්නා

3.පරිසරය හා සංවිධානය වඩා හොඳින් තේරුම් ගැනීමට උපකාරීවන විවිධ අභ්‍යන්තර හා බාහිර තොරතුරු සොයා ලබා ගන්නේ,

1.සබඳතා පවත්වන්නෙක් වශයෙනි.
2.ආයතන ප්‍රධානියා වශයෙනි.
3.නියාමකයා වශයෙනි.
4.බාධා පාලනය කරන්නා වශයෙනි.
5.සාකච්ඡා කරන්නා වශයෙනි.

4.සංකීර්ණ අවස්ථා තුළ මතුවන නව අදහස් විශ්ලේෂණය කිරීමේ මානසික හැකියාව,

1.කළමනාකරණ කුසලතාවයි.
2.සැලසුම්කරණ කුසලතාවයි.
3.මානව කුසලතාවයි.
4.සංකල්පනාත්මක කුසලතාවයි.
5.තාක්ෂණික කුසලතාවයි.

5.සැලසුම්කරණ ක්‍රියාවලියට අයත් කාර්ය පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1.සම්පත් බෙදාදීම,කාර්ය හඳුනාගැනීම,වැඩ බෙදා දීම,අවස්ථා හා තර්ජන හඳුනා ගැනීම.
2.පරිසර විශ්ලේෂණය,බලතල බෙදාදීම,අවස්ථා හා තර්ජන හඳුනා ගැනීම.
3.පරිසර විශ්ලේෂණය,සම්පත් විශ්ලේෂණය,කාර්යසාධන පරාසය විශ්ලේෂණය
4.නායකත්වය,අභිප්‍රේරණය,සන්නිවේදනය,මෙහෙයවීම.

5.ප්‍රමිත ස්ථාපිත කිරීම,කාර්යඵල මැනීම,වැඩ බෙදීම,විචලනය හඳුනා ගැනීම.

6. A - විදුහල්පතිතුමාගේ ඉල්ලීම මත පාසලකට ................. නිෂ්පාදනය කිරීම.

B - අපනයනය සඳහා තේ කුඩු නිෂ්පාදනය කිරීම.

C - නිවසක් සඳහා භූමි අලංකරණ සැලසුමක් නිර්මාණය කිරීම.

ඉහත එක් එක් නිෂ්පාදන ක්‍රම අනුපිළිවෙලින් ගැලපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

1. A - කාර්ය නිෂ්පාදනය B - කාණ්ඩ නිෂ්පාදනය C - ප්‍රවාහ නිෂ්පාදනය
2. A - කාර්ය නිෂ්පාදනය B - ප්‍රවාහ නිෂ්පාදනය C - කාණ්ඩ නිෂ්පාදනය
3. A - ප්‍රවාහ නිෂ්පාදනය B - කාර්ය නිෂ්පාදනය C - කාණ්ඩ නිෂ්පාදනය
4. A - ප්‍රවාහ නිෂ්පාදනය B - කාණ්ඩ නිෂ්පාදනය C - කාර්ය නිෂ්පාදනය
5. A - කාණ්ඩ නිෂ්පාදනය B - ප්‍රවාහ නිෂ්පාදනය C - කාර්ය නිෂ්පාදනය

7.

| පිරියත සැලසුම් වර්ග | උදාහරණ |
|---|---|
| A – ක්‍රියාවලි පිරියත | 1.ගොඩනැගිලි ඉදිකිරීම. |
| B - නිෂ්පාදිත පිරියත | 2.ඇඟලුම් කම්හලක පිරියත සැලසුම් කිරීම. |
| C - කුටි පිරියත | 3.ගෘහ භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයක පිරියත සැලසුම් කිරීම. |
| D - ස්ථාවර ස්ථානීය පිරියත | 4.මෝටර් රථ නිස්පාදන ආයතනයක පිරියත සැලසුම් කිරීම. |

ඉහත පිරියත සැලසුම් ක්‍රමවලට නිවැරදි උදාහරණ දැක්වෙන පිළිතුර තෝරන්න.

1.) A – 2 B – 3 C – 4 D – 1
2.) A – 1 B – 3 C – 2 D – 4
3.) A – 3 B – 4 C – 2 D – 1
4.) A – 4 B – 3 C – 1 D – 2
5.) A – 3 B – 2 C – 4 D – 1

8.

| තත්ත්ව පාලන ක්‍රමය | හැඳින්වීම |
|---|---|
| A - තත්ත්ව කව | 1.අන්තර්ජාතික ප්‍රමිති අනුව නිෂ්පාදනය කිරීම. |
| B - ශුන්‍ය දෝෂ | 2.සෑම නිෂ්පාදනයක්ම දෝෂවලින් තොර වීම. |
| C - තත්ත්ව ආරක්ෂණය | 3.කුඩා කණ්ඩායම් ලෙස එක්ව ගැටළුවලට විසඳුම් සෙවීම. |
| D - ගුණත්ව ප්‍රමිති | 4.කාර්යසාධන දත්ත රූප සටහන් මගින් දැක්වීම. |
| E - සංඛ්‍යානමය ක්‍රියාවලිය | 5.සෑම නිෂ්පාදන අදියරක්ම පරීක්ෂාවට ලක්වීම. |

ඉහත තත්ත්ව පාලන ක්‍රම නිවැරදිව හඳුන්වා ඇති පිළිතුර තෝරන්න.

| | | | | |
|---|---|---|---|---|
| 1.)A – 1 | B – 2 | C – 3 | D – 4 | E - 5 |
| 2.)A – 3 | B – 2 | C – 5 | D – 1 | E – 4 |
| 3.) A – 3 | B – 2 | C – 1 | D – 4 | E - 5 |
| 4.) A – 4 | B – 2 | C – 3 | D – 5 | E – 4 |
| 5.) A – 5 | B – 2 | C – 3 | D – 4 | E - 1 |

සකස් කළේ -

රේණුකා අලුත්වත්ත මිය,
ර/විද්‍යාරාජ විද්‍යාලය.